**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදි දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018**

**පළමු සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය**

**ECN 2128: ලෝක ආර්ථිකය**

**කාලය - පැය දෙකක් (02) පමණයි**

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් ලැබේ.**

**නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු විය හැක.**

---

1. "ලෝක ජනගහනය බිලියනය දක්වා වැඩි වීමට වසර සිය දහස් ගණනක් ගත විය. 1960 දී ගෝලීය ජනගහනය බිලියන 3 ක් කරා ළඟා වූ අතර අද වන විට එය බිලියන 7.5 ක් පමණ වේ."

   i. ගෝලීය ජනගහන වර්ධනය පිටුපස ඇති සාධක කෙටියෙන් විස්තර කරන්න
   ii. ජනගහන වර්ධනය සම්බන්ධ ප්‍රධාන ගෝලීය ආර්ථික ගැටළු මොනවාද?
   iii. වර්තමාන ගෝලීය ජීවන අපේක්ෂාව පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

2. "පශ්චාත් දෙවන ලෝක යුද සමයේ ආර්ථික ප්‍රසාරණය, 1950 සහ 1960 ගණන්වල පශ්චාත් යුද ආර්ථික උත්පාතය ලෙස හැඳින්වේ".

   i. මෙම ආර්ථික ප්‍රසාරණයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?
   ii. පශ්චාත් දෙවන ලෝක යුද සමයේ "රතු විප්ලවය" හා "හරිත විප්ලවය" අතර වෙනස්කම් කෙටියෙන් සලකා බලන්න.
   iii. හරිත විප්ලවයේ ප්‍රධාන ආර්ථික ජයග්‍රහණ මොනවාද?

3. "ඕනෑම රටක භාවිත ආර්ථික දර්ශක අතරින් ආර්ථික වර්ධනය ඉතා වැදගත් දර්ශකයක් ලෙස සලකනු ලැබේ."

   i. ආර්ථික වර්ධනය වැදගත් වන්නේ ඇයි?
   ii. ආර්ථික වර්ධනය හා විදේශ සෘජු ආයෝජන අතර සම්බන්ධතාවක් පවතීද?
   iii. අඛණ්ඩ ආර්ථික වර්ධනයක්, ජාතියක සමස්ත සුබසාධනය සහතික කරයිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

4. "ඉහළ යන ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය, ජාතියක සමෘද්ධිය ඉහළ නංවන දර්ශකයක් ලෙස සලකනු ලැබේ".

   i. ඔබ මෙම ප්‍රකාශනය සමඟ එකඟ වේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.
   ii. ගෝලීය බලශක්ති ප්‍රභවයන් කෙටියෙන් විභාග කරන්න.
   iii. ගෝලීය බලශක්ති ඉල්ලුම සඳහා දායකවන ප්‍රධාන සාධක මොනවාද?

5. "එක්සත් ජනපදය අභිබවා යාමේ හැකියාවක් ඇති සුපිරි බලවතුන් පිළිබඳව විමසා බැලීමේදී, චීනය ශක්තිමත්ම තරගකරුවෙකු ලෙස සැලකේ".
   i. පශ්චාත් දෙවන ලෝක යුද සමය තුළ චීන ආර්ථිකයේ පරිණාමය කෙටියෙන් සලකා බලන්න.
   ii. එක්සත් ජනපදයට තරගයක් ඇති කරන චීනයේ ප්‍රධාන ධනාත්මක සාධක මොනවාද?
   iii. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චීන ආර්ථික ආකෘතිය සුදුසු යැයි ඔබ සිතන්නෙහිද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

6. "වොෂින්ටන් සම්මුතිය "ප්‍රමුඛ ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රවර්ධනය කරන ලද සහ ජාත්‍යන්තර සංවිධානවල සහයෝගය ලබා දෙන නිදහස් වෙළඳපොළ ආර්ථික ප්‍රතිපත්ති මාලාවකට යොමු වූවකි."
   i. ඉහත සඳහන් ප්‍රකාශය කෙටියෙන් පරීක්ෂා කරන්න.
   ii. මෙම ප්‍රතිපත්තිවල ප්‍රධාන ධනාත්මක ලක්ෂණ මොනවාද?
   iii. මෙම ප්‍රතිපත්තිවල ප්‍රධාන දුර්වලතා මොනවාද?

7. "වෙළඳ යුද්ධයක් යනු රටක වෙළඳාම හෝ තීරු බදු සීමා පැනවීම මගින් එකිනෙකාගේ වෙළඳාමට හානි කිරීමට උත්සාහ කරන්නා වූ තත්ත්වයකි."
   i. සුදුසු උදාහරණ යොදා ගනිමින් වෙළඳ යුද්ධය පිළිබඳ සංකල්පය කෙටියෙන් විභාග කරන්න.
   ii. ගෝලීය ආර්ථික වර්ධනය කෙරෙහි වෙළඳ යුද්ධය කෙතරම් දුරකට බලපෑම් කරනු ඇත් ද?
   iii. එක්සත් ජනපදය හා තවත් රටවල් කිහිපයක් අතර වර්තමානයෙහි පවත්නා වෙළඳ යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාක කෙටියෙන් හඳුන්වන්න.

8. පහත ඒවායින් ඕනෑම තුනක් **(03)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   i. හත් දෙනාගේ කණ්ඩායම (G7)
   ii. රේගන්ගේ ආර්ථික විද්‍යාව (Reaganomics)
   iii. ගෝලීය දරිද්‍රතාවය
   iv. බෙහෙවින් ණයගැති දිළිඳු රටවල් (HIPC)
   v. ගෝලීයකරණය

---------------------------------------------0---------------------------------------------